# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීම (විශේෂ විධිවිධාන)

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ තේරීපත් වූ පළාත් පාලන ආයතනවල නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හෝ සභිකයකුගේ ධුරයෙහි පුරප්පාඩු පිරවීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

---

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමා විසින්
2013 ජූලි මස 10 වන දින ඉදිරිපත් කරන ලදී

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[ 254 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන)

එල්.ඩී.—ඕ. 31/2013.

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ තේරීපත් වූ පළාත් පාලන ආයතනවල නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හෝ සභිකයකුගේ ධුරයෙහි පුරප්පාඩු පිරවීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය*

**1.** මේ පනත 2013 අංක  දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ තේරීපත් වූ නගරාධිපති ආදී ධුරවල පුරප්පාඩු පිරවීම.*

**2.** 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ක්‍රියාත්මකව පැවති, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන යටතේ යම් පළාත් පාලන ආයතනයක් සඳහා තේරීපත් වූ නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හෝ සභිකයකුගේ ධුරයෙහි පුරප්පාඩුවක් පිරවීමේ කාර්ය සඳහා 2012 අංක 22 දරන පනතින් අදාළ විධිවිධාන ඉවත් කිරීමේ හෝ සංශෝධන කිරීම් තිබුණ ද, ඒ නොතකා ඒ පුරප්පාඩු පිරවීමේ දී සහ ඒ සම්බන්ධයෙන් එකී ආඥා පනතේ විධිවිධාන අදාළ කරගනු ලැබිය යුතු ය:

එසේ වුව ද, 2012 අංක 22 දරන පනතින් එකී ආඥාපනතට ඇතුළත් කරන ලද 66 ආ වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් කොට ඇති අවස්ථානුගත කරුණු යටතේ නගරාධිපති ධුරයෙහි පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී එවිට ඒ සම්බන්ධයෙන් ඒ උපවගන්තියේ විධිවිධාන අදාළ වන්නේ ය.

*පනත ක්‍රියාත්මක වන කාලසීමාව.*

**3.** මේ පනතේ විධිවිධාන මේ පනත ආරම්භවන දිනයේ සිට වසර හතරක කාලසීමාවක් සඳහා ක්‍රියාත්මකව පැවතිය යුතු ය.

*වලංගු කිරීම.*

**4.** 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ආරම්භවන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී පුරවන ලද නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හෝ සභිකයකුගේ ධුරයේ යම් පුරප්පාඩුවක් වලංගු ලෙස පුරවනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

අර්ථනිරූපණය.

**5.** මේ පනතේ —

"නියෝජ්‍ය නගරාධිපති" යන්නෙන්, මහනගර සභාවක නියෝජ්‍ය නගරාධිපති හෝ නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක උප සභාපතිවරයා අදහස් වේ; සහ

"නගරාධිපති" යන්නෙන්, මහනගර සභාවක නගරාධිපතිවරයා හෝ නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 වන ව්‍යවස්ථාව යටතේ සහතිකය**

ඉහත දැක්වෙන පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයේ අදහස අනුව ජාතියේ හිත පිණිස වහා අවශ්‍ය වන්නා වූ පනත් කෙටුම්පතක් බවට මෙයින් සහතික කරමි.

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2013 ජූලි මස 04 වන දින.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.